# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.23 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/811/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීම - වැල්ලම්පිටිය පොලිස් වසම.

2025.04.22 වන දින රාත්‍රී කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ සාලමුල්ල ප්‍රදේශයේ මහල් නිවාසයක් තුල සිටි පුද්ගලයෙකුට යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් වෙඩි තබා පලා ගොස් ඇති අතර වෙඩි වැදීමෙන් තුවාල ලැබූ පුද්ගලයා කොළඹ ජාතික රෝහලට ඇතුලත්ව දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටියදී 2025.04.22 වන දින රාත්‍රී කාලයේ මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වූ මීතොටමුල්ල, වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචි ඩෑන් ප්‍රියසාද් නැමති පුද්ගලයෙකි.**

මෙම වෙඩි තැබීම සඳහා පිස්තෝල වගර්යේ ගිනි අවියක් භාවිතා කර ඇති බවට සිදුකරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරිරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇති අතර සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**